කාන්තා බාහිර රූපය ඉස්මතු නොකරමු, භාවාතිෂය වාර්තාකරණයෙන් මග හරිමු!

යම් ප්‍රවෘත්තියකට ඍජුව අදාළ නොවන විටකදී පවා කාන්තාවකගේ බාහිර ස්වරූපය ඉස්මතු කිරීමේ භාවිතාවක් ඇතැම් මාධ්‍ය තුළ දක්නට ලැබේ. "රූමත්", "සුරූපී" වැනි යෙදුම් උපයෝගී කරගනිමින් මෙසේ කාන්තා බාහිර ස්වරූපය ඉස්මතු කෙරුණත්, පුරුෂයින්ගේ බාහිර ස්වරූපය හරහා ඔවුන්ව හැඳින්වීමක් දක්නට ලැබෙන්නේ අතිශයින්ම කලාතුරකිනි. ඝාතනයක් වැනි සිදුවීමකදී මෙවැනි යෙදුම් ඔස්සේ කාන්තා බාහිර ස්වරූපය ඉස්මතු කිරීම ඔස්සේ, එම සිදුවීම භාවාතිෂය (sensationalized) ආකාරයකින් දැක්වීමද සිදුවනු ඇත.

වවුනියාවේ ළිඳක තිබූ හමුවූ කාන්තා මළසිරුර පිළිබඳව දිවයින සහ දිනමිණ පුවත්පත් (ජූනි 13, 2022) වාර්තා කොට ඇති ආකාරය ඊට නිදසුනකි. එහි "රූමතිය", "සුරූපී බිරිය", "සුරූපී කාන්තාව" යනාදී වශයෙන් මිය ගිය කත හඳුන්වා දී තිබිණි. එසේම ඝාතනයට ලක්වූ බවට සැක කෙරෙන කාන්තාවගේ ඡායාරූප ද මෙම පුවත් වාර්තා සමග පළ කෙරී තිබිණි.

ඒ අනුව,

1) "රූමතිය", "සුරූපී බිරිය" යනාදී වශයෙන් ඉස්මතු කෙරෙනා මිය ගිය කාන්තාවගේ බාහිර ස්වරූපය මෙම ප්‍රවෘත්තියට අදාළ වන්නේ කෙසේද?

2) ඒ ඔස්සේ මෙම පුවත අනවශ්‍ය භාවාතිෂය ආකාරයකින් දැක්වීමත්, ඒ ඔස්සේ පුවතේ ග්‍රහණය විය යුතු තොරතුරු යටපත් වීමත් සිදු නොවිය හැකිද?

ඔබේ අදහස?